# කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලය අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාර්ත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2011 මාර්තු 06 වන දින පවත්වනු ලැබූ වෙන්දේසියේද ඉවත් කරන ලද වත්කම් අයිතම් 98 ක් හඳුනාගෙන ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි.

(ii) මූල්‍ය ප්‍රකාශනවලට අනුව අවසන් තොගය රු.1,311,618 ක් වූ අතර 2012 දෙසැම්බර් 31 දිනට තොග සත්‍යාපන වාර්තා අනුව එම ශේෂය රු.1,823,731 ක් වයෙන් රු.512,113 ක් වූ වෙනසට හේතු පරීක්ෂා කර ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම ඉකුත් වර්ෂයේදද විගණනයෙන් පෙන්වාදුන් සත්‍යාපන ශේෂය සහ තොග ශේෂය අතර පැවති රු.1,155,719 ක් වූ වෙනස සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

### 1.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

විශ්වවිද්‍යාලවල ආයතන සංග්‍රහයේ 20 වන පරිච්ඡේදයේ 3.1 වගන්තිය සහ 10 වන පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය පරිදි අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සනාථ කරගැනීම සඳහා සහ නිවාඩු සනාථ කරගැනීම සඳහා අදාල පැමිණීමේ ලේඛණ, නිවාඩු ලේඛණ හා , නිවාඩු ඉල්ලුම් පත්‍ර නඩත්තු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයට ගෙවූ රු.9,333,000 ක වැටුප් හා දීමනාවල නිවැරදිතාවය තහවුරු කරගත නොහැකි විය.

### 1.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බාහිර ආයතන දෙකක තැන්පත් කර තිබූ රු.23,932 ක් වසර 04 සිට වසර 08 කට වැඩි කාලයක් නොවෙනස්ව පවතින අතර එම ශේෂ මෙතෙක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආයතන දෙකකින් වර්ෂ 01 සිට වර්ෂ 05 දක්වා කාලයක් අයනොවී පැවතුණු ශේෂය රු.18,357,104 ක් විය.

### 1.2.4 නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකුල නොවීම

පහත සඳහන් අනුකුල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති , රෙගුලාසි හා කළමානාකරණ තීරණ වලට යොමුව | අනුකුල නොවීම් |
|---|---|---|
| (අ) | 2011 අප්‍රේල් 07 දිනැති අංක 45 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ (04)(අ) හා (ආ) ජේද | පර්යේෂණ දමනා ලබා ගැනීමට සුදුසුකම් ලබන නිළධාරීන් / ආචාර්‍යවරුන් පර්යේෂණ යෝජනාව සනාතන සභාව පිළිගත් පර්යේෂණ කලමනාකරණ කමිටුවට ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන පර්යේෂණ දීමනාව ගෙවිය යුතු වුවද , එවැනි කමිටු අනුමැතියක් නොමැතිව 2011 වර්ෂය තුළදී |

| | |
| --- | --- |
| | රු.115,974 ක දීමනා ගෙවා තිබුණු අතර 2012 වර්ෂයේ පර්යේෂණ ප්‍රගතිය පිළිබඳ සෑහීමකට පත්නොවී රු.329,831 ක් ගෙවා තිබුණි. |
| (ආ) ජාතික පුස්තකාල හා ප්‍රලේඛණ සේවා මණ්ඩලයේ 2004/පුස/01 උපලේඛණ චක්‍රලේඛයේ 3.1 ඡේදය | 2006 වර්ෂය ආරම්භයේ සිට 2012 ජුනි 30 දින දක්වා පුස්තකාල පොත් වාර්ෂිකව සමීක්ෂණය කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව , සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය , පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පෙර රු.51,315,198 ක ඌනතාවයක් වූ අතර , ඉකුත් වර්ෂයේ අනුරූපී ඌනතාවය රු.63,236,345 ක් විය. පුනරාවර්තන වියදම් සඳහා රු.62,750,000 ක් වූ රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.11,434,802 ක අතිරික්තයක් බවට පත්ව තිබූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු.52,117,072 ක් වූ රජයේ ප්‍රදාන හේතුවෙන් එම වර්ෂයේ ඌනතාව රු.11,119,273 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු.22,554,075 ක වාසිදායක තත්ත්වයට රජයේ ප්‍රදාන රු.10,632,928 කින් වැඩිවීම , හා අනෙකුත් ආදායම් රු.8,753,670 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

විශ්ව විද්‍යාල පාලක සභාවේ විෂය නිර්දේශය අනුමත කිරීමකින් තොරව වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් 2006 මාර්තු මාසය තුළ දී එම ආයතනයේ පාඨමාලා හදාරන වෛද්‍යවරුන් සඳහා පරිගණක පිළිබඳ නිපුණතා සහතිකපත්‍ර (Certificate of Competence in Computer Application) පාඨමාලාවක් ආරම්භ කර විශ්ව විද්‍යාලයේ සනාතන සභාවේ අනුමැතියකින් තොරව සහතික පත්‍ර නිකුත්කර තිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා මහල් අටකින් සමන්විත "වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයක් " ඉදිකිරීම සඳහා 2008 පෙබරවාරි 22 දින වන විට ඇස්තමේන්තු සකස් කර තිබුණද ,

2012 දෙසැම්බර් 31 දින වන විටත් සකස් කළ ඇස්තමේන්තු වරින් වර වෙනස් කරමින් හා අදාල ආයතනවල අනුමැතිය සඳහා ඉදිරිපත් කරමින් පැවතුණි.

3.3 දෘශ්‍ය අක්‍රමිකතා

2012 වර්ෂයෙ හා 2013 වර්ෂයේ මුල් කාර්තුව තුළ සංග්‍රහ වියදම් පිළිබඳ සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදී අධ්‍යයන අංශයේ පැවැත්වූ රැස්වීම් සඳහා ලබාදුන් ක්ෂණික ආහාර වෙනුවෙන් ව්‍යාජ ලෙස සකස් කළ රබර් මුද්‍රා හා ව්‍යාජ අත්සන් යොදා ප්‍රමාණයන් වෙනස් කර ඉදිරිපත් කරන ලද බිල්පත් 116 ක් වෙනුවෙන් ගෙවීම් වවුචර් 12 ක් මගින් රු.286,284 ක මුදලක් අක්‍රමික ලෙස ගෙවා තිබුණි.

3.4 පාඩු හා හානි

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට අයත් මෝටර් රථය 2009 සැප්තැම්බර් 17 දින පෞද්ගලික ආරක්ෂක ආයතනයේ නියාමකයන් විසින් අනවසරයෙන් රැගෙන ගොස් අනතුරකට භාජනය කර තිබුණි. මෙම අනතුරෙන් රු.338,354 ක අලාභයක් සිදුවීම හේතුවෙන් ආරක්ෂක සේවාවන් සඳහා ගෙවිය යුතු රු.148,686 ක මුදලක් රඳවාගෙන තිබුණද , ඉතිරි රු.189,668 ක පාඩුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 2013 අප්‍රේල් 03 දින විගණනයට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන විගණනය කර 2013 සැප්තැම්බර් 18 වන දින කෙටුම්පත් වාර්තාව නිකුත් කරන ලදී. කෙටුම්පත් වාර්තාවේ රු.215,274,581 ක ගිණුම්කරණ අඩුපාඩු පෙන්වා දුන් අතර රු.214,762,468 ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2013 ඔක්තෝබර් 28 දින ඉදිරිපත් කරන ලදී. තෝරා ගන්නා ලද නියැදියෙන් බාහිරව තවදුරටත් එවැනි අඩුපාඩු තිබීම විගණනයේදී බැහැර කළ නොහැක.

4.2 සංයුක්ත සැලැස්ම

2003 ජූලි 02 දිනැති අංක පීඊඩී 12 අංක දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය ප්‍රකාරව සංයුක්ත සැලැස්මේ අන්තර්ගත කළ යුතු කරුණු ඇතුළත් කර 2011-2015 කාලපරිච්ඡේදයට අදාලව සංයුක්ත සැලැස්ම සකස් කර නොතිබුණි.

4.3 අයවැය පාලනය

-------------------

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පාඨමාලා 87 ක් පවත්වා තිබුණද , පාඨමාලාවන් 80 ක් සඳහා අයවැය ඇස්තමේන්තු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් පාඨමාලාවන් සඳහා අයකරන ගාස්තු වෙන වෙනම හඳුනාගත හැකි පරිදි ගිණුම්ගත නොකිරීම , එක් එක් පාඨමාලාව පිළිබඳ කළමනාකරණයට තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු ලබාගැනීම අපහසු වීම සහ වියදම් පාලනය කිරීමට යොදාගත නොහැකි බව විගණනයේ දී නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂ වෙත වරින් වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) අත්තිකාරම් පාලනය
(ඇ) ණයගැති පාලනය
(ඈ) තොග හා ඉන්වෙන්ට්‍රි ලේඛණ පාලනය
(ඉ) පුස්තකාල පාලනය
(ඊ) ස්ථාවර වත්කම් පාලනය